# නගර ගත වූ විශ්‍රාන්තිය විශ්‍රානතියේ අවතැන්වීම

එස්. ඒ. ඩී. එල්. ඩබ්ලියු. චාරුනී දිසානායක

ලංකාවේ 19 වන සියවසේ වූ රචකයන් අතරින් එක් රචකයෙක් ලෙස ටී .බී. ඉලංගරත්න නොහොත් ටිකිරි බණ්ඩාර ඉලංගරත්න මහතා හඳුන්වා දිය හැක. මොහු නවකතා, ළමාකතා, කෙටිකතා, පරිවර්තන, ස්වයං චරිතපදාන රචනා කරන ලද කතුවරයෙකි.

ටී .බී. ඉලංගරත්නයන්ගේ ඉතා ජනප්‍රිය විලම්බීත, තිලක, තිලක හා තිලකා යන තුන් ඈඳුනු නව කතාවේ පළමුවැන්න වූ විලම්බීත කෘතියට හිමි වන්නේ විශේෂ තැනකි. ප්‍රධාන චරිතය වන තිලකගේ ළමා අවධිය මෙම කතාවෙන් නිරූපනය වේ. තිලක ළමා අවධිය තුල ඔහු විඳි සුන්දර ලෝකය ඇසුරු කර ගනිමින් ගැමි දරුවෙකුගේ විශ්‍රාන්තිය මෙන්ම තිලක නගරයක පාසැලකට යන ජීවිත කතාව ඔස්සේ නගරබද ගුරුවරයෙකුගේ විශ්‍රාන්ති ජීවන රටාව දැකිය හැක.පිටු 205කින් සමන්විත මෙම ග්‍රන්ථයේ තිලක යහලුවන් සමඟ ගෙවනු ලබන ජීවිතය විශ්‍රාන්තිය පදනම් කර ගනිමින් මා විසින් මෙම ලිපියෙහි දක්වනු ලබයි.

"ලේකම් වත්ත පාවුලින් මල් ඔය ගලයි. ගමේ සියල්ල ම වාගේ නාන්නේ මේ ඔයෙනි. හයියෙන් වැහි වැහලා කීප දිනක් ගත වන තෙක් ඔයෙන් එගොඩ මෙගොඩ වෙන්ට නුපුළුවන. වැස්සකට පසු ඔය පිරිසිදුයි. ගැඹුරුයි. වැල්ලත් බොහොම ලස්සනයි. සෙනසුරාදා, ඉරිදා නාන්නට ගියාම වරුවකට ඔයෙන් එතෙර වන්නට හිතෙන්නේ නැත. අලි සෙල්ලම, ගොන් සෙල්ලම, යුද්ද සෙල්ලම... මේ සියල්ලට ම හොඳ තැන වැලෑන මය. නටන්නට, පිනුම් ගසන්නට, පොර බදන්ට හොඳ ම තැන වැල්ලය...." තිලකගේ නිවස අසලින් එසේ නැතහොත් ලේකම් වත්ත අසලින් යන මල් ඔයෙහි දිය නාන අයුරු පිළිබඳව සඳහන් වේ. සතුන්ගේ සෙල්ලම් යුද්ධ පිටියක් ලෙස හඳුන්වන මෙම ඔය, කතුවරයා විසින් ගමේ මිනිසුන් සෙනසුරාදා, ඉරිදා යන විවේකී දිනවල දිය නාමින් විවේකීව ගත කරන අයුරු පෙන්වා දී ඇත."පන්සල ලඟටත් පාලම ලඟටත් පිරිමින් නාන්නට යන අතර ගැහැණුන් යන්නේ පහල මංකඩ ලඟටය. එතන නාන්නට බයක් නැත. මංකඩ ඉහලින් මහ ගල ළඟ වලය. ඊට ඉහළත් පහළත් වැල්ලය. තරුණ උදවිය මහ ගල උඩට ගොස් වලට පනින්නෝය. සැඩ පහරට වැල්ලට ගසා ගෙන ගිය ඔවුහු ආපසු ගල උඩට වින් නැවතත් පනින්නෝය......." ස්නානය කිරීම සඳහා මංකඩ වෙත ගියද ඔවුන් කෙලි දෙලින් එම කාලය ගත කරන අයුරුත් පිහිනමින් වතුරට පැනීමෙන් විනෝදය ළඟා කර ගන්නා අයුරු ඉලංගරත්නයන් පෙන්වා දෙනු ලබයි."මහ වැස්සකට පසු විශාල කුඹුක් ගහක් ඔය හරහට වැටී තිබුණි. එතන නාන්නට ළමෝ බොහෝ ප්‍රිය කළහ. ළමයි කුඹුක් අත්තට නැග ඔයට පැන, කඳ යටින් පිනා ගෙන අනිත් පැත්තට ගියහ. දිනක් දෙකට පාසල් ඇරුණ විට ළමෝ බොහෝ දෙනෙක් එතැන නැවෝය. ඒ පිරිසේ තිලකත් හපුමලීගේ මල්ලී සිරියාත් වූහ......" කුඹුක් ගහක් ඔයට හරහා වැස්සත් සමඟ වැටීමත් හේතු කරගෙන තිලක ඇතුලු ගමේ අනෙකුත් කොලු ගැටයන් ඔයට පැන කඳ සමඟ පීනා කරමින් ගෙවනු ලබන විනෝදකාමී ජීවිතය ගැමි පරිසරයක් තුලින් කතුවරයා විසින් පෙන්වා දෙනු ලබයි."සවස පාසල ඇරුණ විට ළමෝ තේ බී, ඇඳුම් මාරු කර සෙල්ලමට ගියහ. එක තැනක ක්‍රිකට්. තව තැනක පාපන්දු. තව තැනක වොලිබෝල්. තවත් තැනක ටැනිස්. තව තැනක බැඩ්මින්ටන්. තව තැනක බොක්සිං... පොත් ගුල්ලෝ පිංපොං, දාං, චෙස්... හැම තැනම සෙල්ලම්. සරහරු කඩදාසි සෙල්ලමද කලහ. එය අමුතු සෙල්ලමකි.බේබිත් නොවේ, ඕමිත් නොවේ. හත් වාසිත් නොවේ. බ්‍රිජ් කියා එකකි......" ගැමි පරිසරයක සිට නගර ඉංග්‍රීසි විද්‍යාලයකට යාමත් සමඟ ක්‍රීඩාව තුල සිදුවූ වෙනස්කම් මෙහිදී කතුවරයා පෙන්වා දෙනු ලබයි. මේ අනුව විශ්‍රාන්තිමය කටයුත්තක් ලෙස ක්‍රීඩාව යොදා ගැනීම ගමට වඩා නගරයේ යම් තරමක් දුරට දියුණුවී ඇති බව දැකගත හැකි වේ."සුමන ලේකම් වලව්වට ආවේ ඉසතෙල් ගාන දාය. ඔහු එදා එන බවක් තිලක දැන සිටියේ නැත. ඒ නිසා අලුත් අවුරුද්දේ වෙන දා මෙන් කුඹුරේ ක්‍රිකට් සෙල්ලම් කරමින් සිටියේය. එදා එගොඩ ගමත් මෙගොඩ ගමත් අතරේ තරඟයයි....." අවුරුදු දිනයේදී ගමේ ළමුන් එකට එකතුව කුඹුරේ ක්‍රිකට් ක්‍රීඩාවේ යෙදෙන අයුරු මෙහි සඳහන් වේ. එගොඩ ගමෙත් මෙගොඩ ගමෙත් ළමුන් එක්වී අවුරුදු සමයේ ලැබෙන නිවාඩු කාලය ක්‍රීඩාවෙන් එසේ නැතහොත් විශ්‍රාන්තිමය කටයුත්තක් ලෙසින් කරන අයුරු ඉලංගරත්නයන් පෙන්වා දෙයි.

මේ අනුව විලම්බීත කෘතිය හරහා කුඩා පිරිමි දරුවෙකුගේ ජීවන රටාව විශ්‍රාන්තිය තුලින් දක්වා ඇති තැන් බොහෝය. එය ඉහත උපුටා ගැනීම් ඔස්සේ ගම්‍යමාන වේ.

විලම්බීත ටි. බී. ඉලංගරත්න මහතා ස්ටැම්ෆඩ්ලේක් ප්‍රකාශනයකි 1998